# කොළඹ මහා නගර සභාව

## යුරෝපීය ආයෝජන බැංකුව අරමුදල් සපයන මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීම ආයෝජන වැඩසටහන

මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩි දියුණු කිරීම ආයෝජන වැඩසටහන (GCWWMIIP) අදියර 3, යුරෝපීය ආයෝජන බැංකුවේ (EIB) අරමුදල් සමග ක්‍රියාත්ම වන අතර, ඉහත ව්‍යාපෘතිය දැනටමත් ප්‍රදානය කර ඇත. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන අතර, කොළඹ මහා නගර සභාව විසින් ක්‍රියාවට නංවනු ලබයි. 2026 ජූලි 31 වන දිනට පෙර නිමකිරීමට ඉලක්ක කර ඇති ඉහත කාර්යය ක්‍රියාත්මක කිරීමේදී සුදුසු කළමනාකරණ, තාක්ෂණික සහ කොන්ත්‍රාත් අධීක්ෂණයක් සැපයීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත පහත තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට අදහස් කෙරේ. ව්‍යාපෘති පිරිවැය යුරෝ (EUR) මිලියන 50කි.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | අංක 1/ 2019 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව මට්ටම | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු | 02 | PS 03 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, සිවිල්/ යාන්ත්‍රික ඉංජිනේරු ප්‍රථම උපාධිය | සිවිල්/ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වසර 10ක පළපුරුද්ද සහ පොම්පාගාර ව්‍යාපෘතියක් අධීක්ෂණය කිරීම අමතර වාසියකි. |
| ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 04 | PS 04 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධිය | අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වසර 02ක පළපුරුද්ද |
| ව්‍යුහාත්මක ඉංජිනේරු (සිවිල්) | 01 | PS 04 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය | සීකන්ට් පයිල් සැලසුම් (Secant Pile Design) ඇතුළුව ගොඩනැගිලි උපව්‍යුහය සහ උපරිව්‍යුහ මට්මමේ ව්‍යුහාත්මක සැලසුම්කරණය පිළිබඳව අවම වසර 05ක පළපුරුද්ද |
| භූ තාක්‍ෂණික ඉංජිනේරු | 01 | PS 04 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධිය | භූ තාක්ෂණික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වසර 05ක පළපුරුද්ද |
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු (තාක්ෂණ නිලධාරී) | 02 යාන්ත්‍රික - 01 විදුලි - 01 | PS 06 | තෘතියක සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද තනතුරට අදාළ තාක්ෂණ ක්ෂේත්‍රයේ NVQ මට්ටම 7ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම වයස් සීමාව 50 ට අඩු | අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වසර 02ක පළපුරුද්ද |

## ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ, පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 37.5 ක් වන මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු යොදා ඇත. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අර්ධ වශයෙන් නිමකර ඇති පොම්පාගාර සම්පූර්ණ කිරීම සහ කිරුළපන ජල පෝෂක ප්‍රදේශයේ ගුරුත්වාකර්ෂණ අපවහන ජාලය සම්පූර්ණ කිරීම සහ නාගරික අපජල පහසුකම්වල ධාරිතාව වැඩි කිරීමයි. ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා තාක්ෂණ නිලධාරීන් පත්කිරීම අවශ්‍ය වී තිබේ.

| තනතුර | තනතුරු සංඛ්‍යාව | අංක 1/ 2019 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව මට්ටම | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|---|
| සහකාර ව්‍යාපෘති ඉංජිනේරු (තාක්ෂණ නිලධාරී) | 04 සිවිල් - 02 යාන්ත්‍රික - 01 විදුලි- 01 | PS 06 | තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද තනතුරට අදාළ තාක්ෂණ ක්ෂේත්‍රයේ NVQ මට්ටම 7ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම වයස් සීමාව 50ට අඩු | අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වසර 02ක පළපුරුද්ද |

**පොදු කොන්දේසි :**

- සේවා නියුක්තියේ නියමයන් : සියලුම පත්කිරීම් මූලිකව වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර, ව්‍යාපෘතියේ කාලසීමාව තනතුරෙහි අවශ්‍යතාව සහ සතුටුදායක කාර්යය සාධනය මත වාර්ෂික කොන්ත්‍රාත් පදනම මත සේවය දීර්ඝ කිරීමේ පහසුකම ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථානයන්හි සේවයේ නියුතු නිලධාරීන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා එවිය යුතු අතර, මේ පිළිබඳව උනන්දුවක් දක්වන අයවලුන්හට, අදාළ අධ්‍යාපන සහ පළපුරුද්ද පිළිබඳ සහතිකපත්වල පිටපත් සමග ඔවුන්ගේ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් 2025.07.01 දින ප.ව. 3.00ට හෝ ඊට පෙර ලැබෙන පරිදි නාගරික කොමසාරිස්, කොළඹ මහා නගර සභාව, පුරහල වෙත ලියාපදිංචි තැපැල් මගින් එවන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි ව්‍යාපෘතියෙහි නම සහ තනතුර සඳහන් කළ යුතුය. 2019.03.15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලිය පවත්වනු ලබන අතර, ඒ අනුව වැටුප් ගෙවනු ලැබේ.

**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව.**